# ආතති කළමනාකරණය සඳහා දේශීය පැරණි ජනතාව භාවිත කරන ලද සාම්ප්‍රදායික ඥානය

**පී.එස්. චන්දිමා**[1]

ස්වකීය දිවි පැවැත්ම තහවුරු කර ගැනීමෙහිලා අතීතයේ සිට ප්‍රජාව වෘත්තීන්වල නියැලුණු බවට සාක්ෂි මූලාශ්‍රයවලින් හමු වේ. ජීවන ව්‍යවහාරයක් ලෙසත්, ආර්ථික හා සමාජ සුරක්ෂිතතාවය උදෙසාත් වෘත්තියක නියැලීම අවශ්‍යය වේ. වෘත්තියකයන්ට ඇති ප්‍රධාන ගැටළුවක් ලෙස ආතතියට පත්වීම වර්තමානයේ හඳුනාගත හැකිය. ලංකා සමාජයේ බොහෝ වෘත්තීන්වලදී ආතතිය පිළිඹිබු වන රෝග ලක්ෂණත්, ඒ සඳහා නිකුත් කරන ඖෂධත් හඳුනාගත හැකිය. අතීතයේ ආතති කළමනාකරණය කිරීම සඳහා පාරම්පරික ඥානය කෙසේ උපයෝගී කර ගත්තේ ද? යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව ලෙස අවධානය යොමු වේ. අතීත වෘත්තිකයන්ගේ ඥානය ඉවහල් කර ගනිමින් අනාගත වැඩ ලෝකයේ වෘත්තිකයන්ගේ වෘත්තිය ජීවිතය සාර්ථක කරගැනීමට අවස්ථාවක් විවරකර දීම මෙම පර්යේෂණයේ වැදගත්කම ලෙස සැලකේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අතීත ආතති කළමනාකරණය සඳහා භාවිත කර ඇති ශාරීරික, මානසික උපක්‍රම හඳුනාගෙන ඒවා සමාජගත කිරීමයි. ක්ෂේත්‍ර සමීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම ලද වයෝවෘද්ධ තැනැත්තන්ගේ අත්දැකීම් පාදක කරගනිමින් රැස්කර ගන්නා ලද ගුණාත්මක දත්ත විග්‍රහ කරමින් මෙම පර්යේෂණය සිදුකර ඇත. රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද රැකියා නියුක්තිකයන් ආතති කළමනාකරණය කළ අයුරු හඳුනාගත හැකි විය. රාජ්‍ය අංශයේ රැකියාවල නිරත වූ පුද්ගලයන්ගේ ආතති කළමනාකරණයේ දී භාවිත කරන ලද උපක්‍රම අතර කාර්යය බෙදාගැනීම, වගකීම් බෙදා ගැනීම, සේවා කාලය තුළ නියමිත වේලාවට ප්‍රථම රැකියාවට යාම, අභියෝග හඳුනාගනිමින් ඒ සඳහා සාර්ථක සැලසුම් සැකසීම, නුරුස්නා පුද්ගලයන් සමඟ සුහදව ගනුදෙනු කිරීම ආදී උපක්‍රම ආතති කළමනාකරණයේ දී අතීත වෘත්තිකයන් භාවිතයට ගෙන ඇත. පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් ද ආතති කළමනාකරණයේ දී භාවිතයට ගැනුණු උපක්‍රම මෙහිදී හඳුනාගත හැකිය. සේවයේ ස්වාධීනතාවය පවත්වාගෙන යාම, ඵලදායීතාවය ඉහළ නැංවීම, කාර්යක්ෂමතාවය, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ක්‍රියාවට නැංවීම වැනි කර්තව්‍ය මෙන්ම පවුල් ජීවිතය, සගයන් සමඟ ගනුදෙනු කරන ආකාරය ආදී ක්ෂේත්‍රවල දී තමන්ට එල්ල වී ඇති ගැටළු ආදීය මගින් සිදුවන ආතති කළමනාකරණ උපක්‍රම අපගේ නිරීක්ෂණයට බඳුන් විය. ආතති කළමනාකරණය සඳහා පැරැන්නන් භාවිත කළ සම්ප්‍රදායික ඥානයේ උපක්‍රම වර්තමාන රාජ්‍ය සේවකයින් මෙන්ම පෞද්ගලික සේවකයින්ගේ දැනුවත් භාවයට වැදගත් වන බව පැහැදිලිව හඳුනාගැනීමට හැකිය. පර්යේෂණ දත්ත අනාගත වැඩ ලෝකයේ සේවා නියුක්තිකයන්ගේ අඛශ්‍යතාවන්ට උචිත වන අතර එය අනාගත ලෝකයේ වෘත්තිකයන් උදෙසා සාම්ප්‍රදායික දැනුමත් පාරම්පරික ඥානයත් එක්තැන් කළ පර්යේෂණයක් ලෙස හැඳින්විය හැකිය.

**ප්‍රමුඛ පද** : වෘත්තීය, ආතතිය, පාරම්පරික දැනුම, පැරණි සමාජය, ආතති කළමනාකරණය

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.*pschandima@gmail.com*